ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>IOS සාගර්: සුනයනා නෞකාව ශ්‍රී ලංකාවට</u>**

මිත්‍රත්වයේ පාලම් ගොඩනැගීම සඳහා ඉන්දියානු නාවික හමුදාව ගන්නා ප්‍රයත්නය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් ඉන්දියානු නාවික හමුදාවේ සුනයනා නෞකාව IOS සාගර් ලෙස රටවල් 16ක බහු ජාතික කාර්ය මණ්ඩලයක් සමඟින් සිය හත් වන වරාය සනිටුහන් කරමින් 2026 මැයි 15 වන දින කොළඹ වරායට ළඟා වීමට නියමිතය.

2. බංග්ලාදේශය, ඉන්දුනීසියාව, කෙන්යාව, මැලේසියාව, මාලදිවයින, මොරිෂස්, මොසැම්බික්, මියන්මාරය, සිංගප්පූරුව, සීෂෙල්ස්, දකුණු අප්‍රිකාව, ශ්‍රී ලංකාව, ටැන්සානියාව, තායිලන්තය, ටිමෝර් ලෙස්තේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල නිලධාරීන් සහ නාවිකයන්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලය සඳහා ඉන්දිය නාවික හමුදා ආයතනවල ඒකාබද්ධ වරාය පුහුණුව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව IOS සාගර් 2026 අප්‍රේල් 02 වන දින මුම්බායි සිට මුහුදු අදියර අරඹන ලදී. මෙම පුහුණුව තුළින් නාවික කාර්යභාරයන්, යාත්‍රා කිරීම් සම්බන්ධ කටයුතු, සන්නිවේදන ක්‍රමවේද, මුහුදු ජීවිතයේ සුරක්ෂිතතාවය, ගිනි නිවීම් සහ හානි පාලනය වැනි කරුණු මෙන්ම සංචාර, VBSS මෙහෙයුම් සහ උසස් නාවික පාලන සහ මෙහෙයුම් කුසලතා වැනි සුවිශේෂී මොඩියුල ආවරණය කරන ලදී.

3. වරාය සංචාරය අතරතුරේදී, නෞකාවේ අණදෙන නිලධාරීතුමා ශ්‍රී ලංකා නාවික හමුදාවේ බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරීතුමා සහ අණදෙන නාවික බලකායේ ධජ නිලධාරීතුමා හමු වනු ඇත. බහු ජාතික කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ වෘත්තීය සහ ක්‍රීඩා අන්තර්ක්‍රියාවන්හි නිරත වනු ඇති අතර ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සංචාරයන් හිද නිරත වනු ඇත.

4. මෙම සංචාරය සමුද්‍රීය ආරක්ෂාව උදෙසා සමුද්‍රීය හවුල්කරුවන් අතර වඩා ගැඹුරු නියැලීමක් සහ සහයෝගීතාවයක් ප්‍රවර්ධනය කරමින් එකම සාගරයක් එකම මෙහෙවරක් යන දැක්ම පිළිබිඹු කරයි. IOS සාගර් මුලපිරීම සහ කොළඹ වරාය සංචාරය ගරු අග්‍රාමාත්‍යතුමාගේ මහාසාගර් (MAHASAGR) දැක්ම හා සමපාත වන අතර එතුළින් ඉන්දියානු සාගර කලාපය තුළ සහයෝගී සමුද්‍රීය නියැලීමක් සඳහා ඉන්දිය නාවික හමුදාවේ කාර්යභාරය පිළිබිඹු වේ.

***

**කොළඹ**

***2026 මැයි 14***